# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/41 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාද — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (70)/76.

### (40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

#### නියෝග

1. මේ නියෝග හදිසි අවස්ථා (තණ බිම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ යම් රජයේ ඉඩමක් තණ බිමක් වශයෙන් වෙන් කර තැබිය යුතු යයි, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, නියම බලධරයා විසින් කලින් කල ප්‍රකාශ කරනු ලැබිය හැකිය. එවැනි ඉඩමක් මින් මතු මේ නියෝගවල '' තණ බිම් '' යනුවෙන් සඳහන් කරනු ලැබේ.

3. යම් තණ බිමක් පාවිච්චි කිරීම හෝ එහි පදිංචිවීම, නැතහොත් එය පාවිච්චි කිරීමට හෝ එහි පදිංචිවීමට සැලැස්වීම සඳහා නියම බලධරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ තැනැත්තකු නොවන කිසිම තැනැත්තකු විසින් එය පාවිච්චි කිරීම හෝ එහි පදිංචිවීම හෝ එය පාවිච්චි කිරීමට හෝ එහි පදිංචිවීමට සැලැස්වීම නොකළ යුතුය.

4. (1) යම් තැනැත්තකු 3 වන නියෝගය කඩ කරමින් යම් තණ බිමක පදිංචිව සිටින බව නියම බලධරයාගේ මතය වන අවස්ථාවක ඒ බවට සහතිකයක් පොලිස් පරීක්ෂකවරයකුගේ තත්ත්වයට නොඅඩු තත්ත්වයක පොලිස් නිලධරයකු වෙත ඔහු විසින් නිකුත් කළ හැකිය.

(2) නියම බලධරයා විසින් (1) වන ඡේදය යටතේ සහතිකයක් නිකුත් කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා මින් මතු මේ නියෝගවල '' නීති විරෝධී පදිංචිකරු '' යනුවෙන් හඳුන්වනු ලැබේ.

(3) (1) වන ඡේදයෙහි සඳහන් සහතිකය නිකුත් කිරීමට පෙර, නීති විරෝධී පදිංචිකරුට, ඔහුගේ නිදහසට ඇති කරුණු කීමට අවස්ථාවක් දීමේ කාර්යය සඳහා නියම බලධරයා අවශ්‍ය යයි සලකන පරීක්ෂණයක් ඔහු විසින් පවත්වනු ලැබිය යුතුය.

(4) (3) වන ඡේදය යටතේ පරීක්ෂණයක් පැවැත්වීමේ කාර්යය සඳහා නීති විරෝධී පදිංචිකරු වෙත දැන්වීමක් බාරදීම හෝ දැන්වීමක් බාරදීමට සැලැස්වීම හෝ නියම බලධරයා විසින් කළ යුතුය. නියම බලධරයාට නීති විරෝධී පදිංචිකරු වෙත පුද්ගලිකව ම දැන්වීම බාරදීම හෝ, බාරදීමට සැලැස්වීම හෝ කළ නොහැකි වන අවස්ථාවක ප්‍රස්තුත ඉඩමේ ප්‍රකටව පෙනෙන ස්ථානයක අලවනු ලබන දැන්වීමක්, නීති විරෝධී පදිංචිකරු වෙත කරනු ලැබූ ප්‍රමාණවත් දැන්වීමක් ලෙස සලකනු ලැබිය යුතුය.

97A——ජ 24285—2,100 (76/12)

5. (1) ප්‍රස්තුත තණ බිමෙන් නීති විරෝධී පදිංචිකරු නෙරපීම සහ එම තණ බිමෙහි යම් වැටක්, ගොඩනැගිල්ලක් හෝ වෙනත් ඉදි කිරීමක් ඇතොත් එය කඩා දැමීම ද එම තණ බිමෙහි ඇති මෙවලම්, උපකරණ හෝ පශු සම්පත් කිසිවක් හෝ යම් වගාවක පලදාව හෝ තහනමට ගැනීම ද, නියම බලධරයාගෙන් 4 වන නියෝගය යටතේ සහතිකය ලබන පොලිස් නිලධරයාගේ කාර්යය වන්නේය :

එසේ වුව ද, නීත්‍යානුකූල අයිතිවාසිකම් බලහීන කරමින් කරනු ලබන නෙරපා දැමීමකින් හෝ දේපළ තහනමට ගැනීමකින් අතෘප්තියට පත් වන එවැනි යම් නීති විරෝධී පදිංචිකරුවකු විසින් සන්තකය නැවත ලබා දෙන ලෙස හෝ, අලාභ අයදිමින් හෝ රජයට විරුද්ධව උචිත අධිකරණයක සිවිල් නඩුවක් පවරනු ලැබිය හැකිය.

(2) (1) වන ඡෙදයේ සඳහන් කරනු ලැබූ පොලිස් නිලධරයා විසින් මේ නියෝගය යටතේ ඔහුගේ කාර්යයන් ඉටු කිරීමේ දී යුක්තිසහගත ලෙස අවශ්‍ය යයි තමා සලකන ප්‍රමාණයක බලය පාවිච්චි කිරීම ද පොලිස් හමුදාවේ වෙනත් යම් සාමාජිකයන්ගේ සහාය ඉල්ලා සිටීම සහ ලබා ගැනීම ද ඔහු විසින් කළ හැකිය.

6. නීති විරෝධී පදිංචිකරුවාට විරුද්ධව වෙනත් යම් නීතියක් යටතේ නඩු පැවරීම හෝ නඩු කටයුතු පවත්වා ගෙන යාම මේ නියෝගවල ඉහතින් වූ විධිවිධානවලින් තහනම් කෙරෙන ලෙස තේරුම් නොගත යුතුය.

7. (1) යම් තැනැත්තකු මේ නියෝගවල විධිවිධාන කඩ කරන අවස්ථාවක, ඔහු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් සියයකට අඩු නොවන්නා වූ ද රුපියල් පන් දහසක් නොඉක්මවන්නාවූ ද දඩයකට ඔහු යටතේ වන්නේ ය.

(2) යම් තැනැත්තකු මේ නියෝග යටතේ වරදකරු කරනු ලැබූ විට, (1) වන ඡෙදය යටතේ නියම කරනු ලබන යම් දඬුවමකට අමතරව, 5 වන නියෝගය යටතේ තහනමට ගන්නා ලද මෙවලම්, උපකරණ හෝ පශු සම්පත් කිසිවක් හෝ යම් වගාවක පලදාව හෝ රාජ්‍ය සන්තක කළ යුතු යයි මහේස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය හැකිය.

මේ නියෝගවල—

"නියම බලධරයා" යන්න යම් රජයේ ඉඩමක් සම්බන්ධයෙන් යෙදුණු විට, එම රජයේ ඉඩම පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක ද ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා හෝ එම දිසාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් හෝ අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී